

‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු

| 60 වන කාණ්ඩය | බු. ව. 2561 ඉල් මස පුර පසළොස්වක ද ව්‍ය. ව. 2017 නොවැම්බර් 03 වන ද | 07 වන කලබ |
| --- | --- | --- |

# අමරදේව හරසර

*ආචාර්ය පණ්ඩිත් ඩබ්. ඩී. අමරදේවයන් ගේ වියොවින් වසරක් පිරීම නිමිත්තෙනි*



අමර මියුරු බසින් මුව’ග
මානව හද තත් පිරිමැද
අමර ගීතයෙන් හෙළය ම
සැනැහූ රසවතා ඔබ ය

කිත් පැසැසුම් මැද දස දෙස
සිත් සතොසින් හැර මන් තෙද
සුපහන් කළ මනු පෙම් විල
සඳකත්මිණ ඔබ ය අමිල

සුසර කරවමින් සුබස ම
මිහිර පුරවමින් දන මන
නො මියේ ඔබ කළ මෙහෙවර
මහ ගඳඹා ඔබ ය පවර

- අනඳ



# පණ්ඩිතයා යනු කවරෙක් ද ?

*අපවත් වී වදාළ පරමපූජනීය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් ලියන ලද්දකි.*

"දිට්ඨෙව ධම්මෙ යො අත්ථො
යො ච’ ත්ථො සම්පරායිකො
අත්ථාභිසමයා ධීරො
පණ්ඩිතොති පවුච්චති"

(මෙලෝ පරලෝ වැඩ
දෙක ම එකසේ නොඅඩු වැ
සලකා ගැනීමෙන් මැ යැ
'පඬි' යැ යි කියනු ලබනේ)

යනු බුදුන් වහන්සේ කොසොල් මහරජහට වදාළ බැවින් මෙලොවැ අර්ථය ද පරලොවැ අර්ථය ද යන දෙක ම සිදුකැරැ ගැනීමෙන් "පණ්ඩිතයා" යැ යි කියනු ලැබේ. මෙලොව නම් දැන් මේ ජීවත් වැ වෙසෙන ප්‍රත්‍යක්‍ෂ වූ ලෝකයයි. අර්ථය නම් අර්ථනය = ප්‍රාර්ථනය කරනු ලබන දේ-" යන නිර්වචනාර්ථයෙන් කියැවෙන - සියලු අභිවෘද්ධිය යි. සියලු යහපත පිළිබඳ දියුණුවයි. ඒ මෙලොවැ දියුණුවත් ධනයෙන් දියුණුවීම යැ- ගුණයෙන්

දියුණුවීම යැ- සදාචාර වූ සභ්‍යත්‍වයෙන් දියුණුවීම යැ- ශිල්ප ශාස්ත්‍රයෙන් ඉගෙනීමෙන් දියුණුවීම යැ- යනාදී වශයෙන් නොයෙක් ආකාර ඇත්තේ වේ. පරලොව නම් මෙලොවැ ජීවිතයා ගේ අවසානයෙන් (මරණයෙන්) පසු තනි තනියේ තම තමා විසින් ස්වකීය කර්මානුරූප වැ යායුතු තැන යයි ආගම වශයෙනුත් යුක්ති වශයෙනුත් විශ්වාස කරනු ලබන්නා වූ අප්‍රත්‍යක්‍ෂ වුවත් (ඇස් කන් ආදී ඉන්ද්‍රියයනට මුණ නො ගැසුණත්) අනුමිති වශයෙන් සිද්ධ වූ (ඒ ඒ ආගමයට හා යුක්තීනට අනුවැ ප්‍රමාණ කැරැ බැලීමෙන් ඇත්තක් විද්‍යමාන දෙයක් බව ඔප්පු වූ) මේ ජන්මයෙන් මතු ජාතීන්හි ලැබිය යුතු ආත්මභාවය යි. ඒ පරලොව පිළිබඳ අර්ථය නම්, ඒ මතු ජාතීන්හි දුගතියෙන් තොර වැ සුගතියෙකැ ඉපැද්ම යැ- ඒ උපන් තන්හි උපධි සම්පත් හෙවත් දුටුවන් පහදනා රූප සම්පත් ලැබීම යැ- කුල සම්පත් ධන සම්පත් පරිවාර ලැබීම යැ- යන ආදී වශයෙන් නොයෙක් ආකාර ඇත්තේ යැ. "මෙවැනි ලෞකිකාර්ථයන් ඉක්මැ ගියා වූ ලෝකෝත්තරාර්ථ සංඛ්‍යාත සතර මඟ සතර ඵල නිවන් ලැබීමට උපනිඃශ්‍රය වන කුසල් රැස්කිරීම ද මේ පරලෝකාර්ථයෙහි ම ඇතුළත් වේ. පරලොවැ දී ලැබිය යුතු වූ සුගති ප්‍රතිසන්ධි හා ඒ ඒ සුගතියෙහිත් කුල සම්පත් ධන සම්පත් යන ආදීන් ගේ වශයෙන් ලැබිය යුතු සියලු සම්පත් දැ යි යන පරලෝකාර්ථ නම් වූ ඵලය නිපැදවීමට හේතු වූ කුසල් මෙලොවැ දී රැස් කැර ගැනීම මෙතැන්හී ඵලෝපචාර වශයෙන් (සුගති ආදී පරාලෝකාර්ථ සංඛ්‍යාත ඵලයාගේ නාමය එය ලැබීමට හේතු වූ කුසලයෙහි ආරෝපණය කොට නගා ව්‍යවහාර කිරීම් වශයෙන්) පරලෝකාර්ථය සලසා ගැනීම නම් වේ. මේ මෙලෝ පරලෝ වැඩ දෙක ම එකක් පාසා ආත්මාර්ථ යැයි පරාර්ථ යැයි ද දෙවැදෑරුම් වේ. තමා සහ තමා පිළිබඳ දූ දරු ආදීන්ගේ මෙලොව දියුණුව සලසාගැනීම,

පොදු අසල්වැසියන්ගේ රට වැසියන් ගේ මුළු ලෝ වැසියන් ගේ මෙලොව දියුණුවට මං සලසා දීම, තමා සහ තමා පිළිබඳ පිරිසගේ පරලෝකාර්ථය වශයෙන් ප්‍රාණවධාදී දුශ්චරිතයෙන් තොරව දාන ශීල දයා දක්ෂිණාාදී සුචරිතයන්හි යෙදීමෙන් කුසල් රැස්කර ගැනීම, අසල්වැසියන් පටන් කොට පොදු ලෝවැසියන් දුසිරිතින් මුදා සුසිරිතෙහි යොදා පරලෝකාර්ථය සම්පූර්ණ වන පරිදි ස්වප්‍රතිපත්තියෙන් ආදර්ශදානයෙන් හා (තමාගේ පිළිපැදීමෙන් ආදර්ශයන් දක්වා දීමෙන් හා) අවවාද අනුශාසන ධර්මදානාදී වශයෙන් **පරලොව අතින් පරාර්ථ චර්යාවෙහි යෙදීම** යන මේ සතර කොටසුන් ගේ වශයෙනි. මෙලොව පරලොව වශයෙන් සාමාන්‍යයෙන් දෙවැදෑරුම් වූ **ස්වාර්ථයන් සර්වාකාරයෙන් සර්වාංග සම්පූර්ණ ව සලසා** වදාළ **තුන් ලොවෙහි අසහාය මහා පණ්ඩිතෝත්තමයාණන් වහන්සේ බුදු රජාණන් වහන්සේ ය.** සෙසු හැමෝ ම ඒකදේශ පණ්ඩිතයන් (එක් එක් දෙසින් පඬි නම් වූවෝ ය.) බුදුන් වහන්සේ ගේ ආත්මාර්ථය සකල ලෞකික ලෝකෝත්තර ගුණජාතය ඉක්ම ව පැවතියේ ය. පරාර්ථය ද මුළු තුන් ලොව ම පුරා පැවතියේ ය. සෙස්සන් ගේ ආත්මාර්ථය ද තම තමන් ගේ ශක්ති ප්‍රමාණය හිමි කොට ඇත්තේ ය. පරාර්ථය ද තමන් තමාට විෂය වන තාක් තන්හි ම පැවැතෙන්නේ ය. මේ චතුර්විධ වූ අර්ථයෙන් එකක් පමණක් - හෙවත් - මෙලොව ආත්මාර්ථය පමණක් සලසා ගන්නේ පාද පණ්ඩිතයෙක් හෙවත් සතරෙන් කොටසේ (කාලේ) පණ්ඩිතයෙකි. දෙකක් හෙවත් තමා හා අනුන් ගේ මෙලොව අර්ථය පමණක් සලසා ගන්නේ අර්ධ පණ්ඩිතයෙකි. තුනක් පමණක් හෙවත් එකී ඉහලෝකාර්ථද්වයය හා තමා ගේ පමණක් පරලෝකාර්ථය ද සලසා ගන්නේ ත්‍රිකාණ්ඩ පණ්ඩිතයෙකි. එක් කඩතොල්ලක් හැර තුන් කඩෙකින් යුතු වූ ත්‍රිකාණ්ඩ පණ්ඩිතයෙකි. සතර අර්ථය

ම සලසා ගන්නේ සම්පූර්ණ පණ්ඩිතයෙකි. හෙවත් අඩුනැති පඬියෙකි. **මෙ සතර ම නො සලසා ගන්නේ මූඪයෙකි. අන්ධ බාලයෙකි, මනුෂ්‍යජාති වෘක්ෂයේ පිළලෙකි.** මෙසේ තමාගේත් අනුන්ගේත් උභය ලෝකාර්ථ සාධනයෙන් ම මුත් (දෙලොව දියුණුව සිදුකර ගැනීමෙන් මිස) **පත් පොත් ඉගෙනීමෙන් වත් - උපාධි ලැබීමෙන් වත් - රටපුරා පතුරුවාගත් නමින් වත් කටපුරා උතුරුවන වතුරුවන ප්‍රකාරණයෙන් (පුරසාරමෙන්) වත් - මව්පිය ගුරුවරු ආදීන් ගේ පරම්පරාගත උගත්කම් ආදියෙකින් වත් "පණ්ඩිත" නම් නොවේ.** කොතෙක් උගතත් ආත්මාර්ථ පරාර්ථද්වයය නො සලසා ගනුයේ උගත් මූඪයෙකි. ඔහුගේ උගත් බව ආත්මාර්ථ මාත්‍රයත් වනසන බැවින් හුදෙක් අනර්ථයට ම හේතු වේ.

**"යාවදේව අනත්ථාය - ඤත්තං බාලස්ස ජායති"**
(හුදු අවැඩට ම වේ - අඳබලහු ගෙ උගත්කම)

යනු ධම්මපදයෙහි වදාළේ එහෙයින් ම ය. එසේ තමා උගත් දේ තමාත් නො පිළිපදිමින් අනුනුදු නොපිළිපදවන තැනැත්තේ තුච්ඡ පුරුෂයෙකි. (හිස් මිනිසෙකි). ඔහුගේ ශිල්පශාස්ත්‍ර ඥානයත් ධර්මඥානයත් සිතට මහ බරක් වනු පමණෙකි. යම් සේ පිටින් හකුරු පොල් උසුලා වෙහෙසෙන ගොනා හෝ කොටළුවා (බූරුවා) කිසි කලකෙත් එහි රස නොවිඳින බැවින් බර පමණක් දනී ද? වෙහෙස පමණක් විඳී ද? එසේ ම ඇතුළතින් හෙවත් සිතින් පමණක් ශිල්පශාස්ත්‍ර ධර්මඥානයක් උසුලා වෙහෙසෙන්නවා වූ ඒ ශිල්පාදීන් නිරවද්‍ය වූ ආත්මාර්ථ පරාර්ථ සඳහා කායවාක් ප්‍රයෝගයන්හි (ක්‍රියාවන් හා කථාවන්හි නොයොදන්නා වූ අනර්ථ පිණිස නොමඟ හෝ යොදන්නා වූ උගතා ගේ දැනීම ද ඔහුට ම බරක් හා ලොවට ද බරක් (වෛරයක්) වනු පමණෙකි. එහෙයින් ලෞකික පණ්ඩිතයෝ ද,

"ඥානං භාරං ක්‍රියාං විනා"

(කැරුමෙන් තොර දැනුම - සිත පෙළනා මහ බරෙකි.

නිති සිතිනි බර උසුලා - වැහැරේ එබඳු උගතා) යනු කීහ.

මේ කාලයෙහි මේ අපගේ කුඩා දිවයින තබා අනෙක් මුළුලොව නොයෙක් විශාල දේශාන්තරයන්හි නා නා ශාස්ත්‍ර විශාරද වූ මහ උගතුන් වැඩිදෙනා මෙලොව ආත්මාර්ථය ම තකා ඔවුන් ගේ ඒ දැනුම අනුන් ගේ රටවලුත් ලාභත් සහමුලින් තනි තනියේ කොල්ලකා ගැනීමට යොදන බව ද සා දුකින් පෙළෙන මිනිස්නට පිරිනැමිය යුතු දයාව වෙනුවට ගිනි වෙඩි බෝම්බ විෂධූමාදිය පිරිනමන සැටි ද අසන අප රට උගතුන් හටත් තදනුගමනය රිසිවීම පුදුමයක් නොවේ. ඒ උගත්තු උගතුන් මුත් පණ්ඩිතයෝ නම් නො වෙති. "**පරාර්ථාය න කීර්තයෙ**" (පරවැඩ පිණිස ම ය, කීර්තියක් සඳහා නම් නො වෙයි). මුරදෙන ඇතැම් ගිහියන් තබා පැවිද්දන් වෙත දැනුම් තබා බණ දැනුම් පවා "**න පණ්ඩිතා වෙතන මාදියන්ති**" (පඬුවෝ නම් කුලී නො උදෙසති. නො තකති. බලාපොරොත්තු නො වෙති). යන බණට නුහුරු ලෙස යොදන ප්‍රස්ථාවයෝ දකින්නටත් ලැබෙති. අසන්නටත් ලැබෙති. මෙසේ දැන් ලෝකය ආත්මාර්ථකාමී වුවත් නින්දිත වුවත් නො පිරිසිදු වුවත් **ධර්මදීපවාසී වූ අප බෞද්ධ ගිහි පැවිදි පිරිස දිවි හිමියෙන් නමින් නො වැ ක්‍රියාවෙන් ම නියම බෞද්ධ පණ්ඩිතයන් වන්නට ඉටා ගනිත්වායි පතම්හ.**



බෞද්ධ ළමයා ගේ දස පිළිවෙත – 2

# කිසිවකුටත් හිංසා නොකිරීම

*සිරි වජිරාරාමාධිපති ව වැඩ විසූ*
*අපවත් වී වදාළ අතිපූජ්‍ය නාරද මාහිමිපාණන් වහන්සේ විසිනි*

හිංසාවට කවුරුත් කැමති නො වෙති. තමාහට හිංසා කරන කල තමා කැමැති නො වෙති. සෙස්සෝ ද එසේ මැයි. අනුන් තම හට උපමා කොට කිසිවකුට වත් සිතින් හෝ වචනයෙන් හෝ ක්‍රියාවෙන් හිංසා නො කළ යුතු ය.

අනුනට විපතක් වේවා, අනුන්ගේ සැපයට බාධා වේවා යන ආදීන් සිතීම සිතින් හිංසා කිරීම වේ. මෙ බඳු හිංසා අදහස්වලින් අනුනට වඩා තමා හට හිංසා සිදු වේ. තමාගේ සිත පළමු කොට කෙලෙසේ. සිත කෙලෙසීමෙන් කය ද කෙලෙසේ. කිලිටි වූ මුහුණින් එය පෙනේ. සිත පිරිසිදු වූ කල මුහුණ පිරිසුදු වේ, සෞම්‍ය වේ. ළඟ සිටින අයට ද එය දැනේ. එහෙයින් ම ළද බොළඳ සත් හැවිරිදි රහල් කුමරා බුදුරදුන් වෙත පැමිණ දැවැද්ද ඉල්ලමින් "**සුඛා වත තෙ ඡායා සමණ**" යනුයෙන් "මහණ, ඔබවහන්සේ ගේ සෙවණැල්ල ද මට සනීප ය" යි කී ය.

ක්‍රෝධය ද තමහට හා පරහට සිතින් කරන තව හිංසාවෙකි. මෙයින් කයට බොහෝ හානි සිදු වේ. කුඩා ළමයින් හට තරහ නො හොබී. වහා කිපෙන ළමයි ඉක්මනට මහලු වෙත්. තරහ පහළ වන විට බුදුරදුන් සිහි කොට නමස්කාර පාඨය කියන්න. නැතහොත් ඇස් වසා "**ඉතිපි සො**" යන ආදී පාඨය කියන්න.

නිඳන්නට පෙර මේ හොඳ ළමයා කී වරක් තරහ වී දැයි ගණන් කරන්න. තමා කෙළේ වරදකැයි සිතා එසේ තරහා නොවන්නට ඉටා ගන්න. එදින තරහ වූ වාර ගණනට මල් ගෙන පසු දින බුදුන් පුදන්න.

තරහා නොවන අහිංසක ළමයි රෝස මල මෙන් කා හටත් ප්‍රිය බව සලකන්න.

අහිංසක හොඳ ළමයා අනුනට ඊර්ෂ්‍යා ද නො කෙරෙයි. අනුන් තෑගි දිනා ගත් විට හෝ පන්තියේදී අනුන් තමහට වඩා උසස් වූ විට හෝ හොඳ ළමයා අනුනට ඊර්ෂ්‍යා නො කෙරෙයි. අනුන් ගේ සැපත තමා ගේ සැපත මෙන් සිතන්න. තමාගේ දියුණුවට අනුන් ඊර්ෂ්‍යා කරනවාට මේ හොඳ ළමයා කැමති නොවන්නාක් මෙන් අන් ළමයි ද ඔවුන් ගේ දියුණුවට ඊර්ෂ්‍යා කිරීම ගැන කැමැති නො වෙති.

ඊර්ෂ්‍යාව සිත විනිවිද යන, කන විනිවිද යන, ඇස විනිවිද යන තියුණු උලෙකි.

එබඳු උලෙකින් තමාගේ සිතට, කනට, ඇසට ඇණ ගැනීමට කවරෙක් සතුටු වෙයි ද?

මේ හොඳ ළමයා යම් දවසෙක බුදු වෙයි, නැතහොත් රහත් වෙයි. එසේ බුදු වන්නේ, රහත් වන්නේ අනුන් සුවපත්

කිරීමට ය. එසේ නම් මතු බුදුවන්නට හෝ රහත් වන්නට පෙර මේ හොඳ ළමයාගේ සහෝදරියක හෝ සහෝදරයකු දියුණුව සිටිනවා දැකීමට සතුටු විය යුතු ය.

යමෙක් කිසි ම දෙයක් බලාපොරොත්තුවෙන් මඟ යන්නා වූ අය තළා පෙළා හෝ මරා දමා හෝ බඩු පැහැර ගන්නේ ද ඔහු වසලයෙකැ යි දැන ගනුව. මංකොල්ල කමින් අනුන් තළා පෙළා ක්‍රියා කරන්නා වසලයෙකැ යි බුදුරදුන් දේශනා කළ සේක.

මංපැහැරුම් ආදී ක්‍රියා ඉතා ම දරුණු ය. යහපත් බෞද්ධයකු එබඳු දැයක් කිරීම තබා සිතන්නේ වත් නැත. මලින් රොන් ගන්නා වූ මී මැස්සෙක් මල නො තළයි. මලේ පැහැය ද විනාශ නො කරයි. සුවඳට ද හානියක් නො කරයි. වස්තුව සපයන තැනැත්තා ද කාට වත් හිංසා නො කොට, අලාභ නො කොට දැහැමින් වස්තුව සැපයීමෙන් මී මැස්සා අනුකරණය කළ යුතු යි. නොදැහැමින් නම් ශක්තිය ඇති පමණට ම වස්තුව රැස්කර ගත හැකි ය. එහෙත් කරුණු සහිත ව සිතීමේ දී නිවරද දැයක් කෙළෙමැ යි සැනසෙන්නට නොහැකි නම් මහා රාජ්‍යයක් පමණ දැයක් ලබා ගත්තත්, එය මෙලොව ම පශ්චාත්තාපයට හේතු වේ. පර ලොවැ අපායාදී දුකටත් කාරණ වේ.



# උදෙන් නැගිටීම

***අරිසෙන් අහුබුදු කලාසූරීන් විසිනි***

කාක්කා : කාක්, කාක් නැගිට උදේ
අකුරු කියම් නො සිට ඇදේ

කුකුළා : කුක් කු කුක් නැගිට උදේ
අකුරු ලියම් මිදුල මැදේ

කොහා : කුහූ කුහූ, නැගිට උදේ
සින්දු කියම් මිහිරි ලෙදේ

ලේනා : ටිං ටිං ටිං නැගිට උදේ
අතු අග ඉඳ ගසම් පදේ

මී මැස්සා : රූං රූං රූං නැගිට උදේ
රොන් ගනිමින් බඳිමි වදේ

ළමයා : අපි ඔක්කොම නැගිට උදේ
වැඩක් කරමු සතුට ඇදේ

හැමෝම : අවදි වුණොත් රැයින් උදේ
කම්මැළිකම් ඉවත ඇදේ
ඇඟට පතට සවිය යෙදේ
වැඩක් කරමු රටට, හොඳේ



# කාම උගුලෙන් මිදෙමු

***රංජනී සමරදිවාකර නැන්ද විසිනි***

අද අපට කතා කරන්නෙ තියෙන්නෙ තුන්වැනි සිල් පදය ගැනයි පුතා. ඉන් කියවෙන්නේ කාමයන් පිළිබඳව, වැරදි ආකාරයෙන් හැසිරීමෙන් වළකිමියි කියල නේද? ඒ සඳහා මුලින්ම කාමයන් කියන්නෙ මොනවද කියල දැනුම්වත් වෙන්න වෙනවා. ලිපිය පටන් ගන්නෙ කොහොමද කියල හිතහිතා ඉන්න කොට, පහුගිය ජූලි මාසෙ **බෞද්ධ ළමයා** පොත හම්බ වුණා. ඒ පොතේ අපේ ගෞරවනීය තල්පාවිල කුසලඥාණ ස්වාමීන් වහන්සේගේ **ඇසළ සඳයි - දම්සක් නදයි** කියන ලිපිය දුටුව ම තේරුණා, උන් වහන්සේ මේ කාමයන් ගැන ලොකු විස්තරයක්, ඒ ලිපියෙ ඉදිරිපත් කරලා තියෙන බව. ඒක අපට ලොකු උපකාරයක් වුණා පුතා. ඉතින් අපි උන් වහන්සේට කෘතඥතාපූර්වක ව පුණ්‍යානුමෝදනා කරලම, ලිපිය පටන් ගනිමු.

කාමය කියන වචනෙ නම් පුංචි පුතාල දූලට තේරුම් ගන්න අපහසු ඇති. ඒ වුණාට පුතාල දූල ආශාව කියන වචනෙ දන්නවා නේ. ඔය ආශාවම තමා ඒ ඒ දේවලට වැඩි වැඩියෙන් ආසා කරන්න කරන්න, වැඩි දියුණු වෙලා තණ්හාවක් බවට

පත්වෙන්නෙ. තණ්හාව හරි හැටියට අඳුනා ගත්තෙ නැති වුණාම, පාලනය කර ගන්න බැරි වෙනවා. එතකොට එයා තව තවත් වැඩි දියුණු වෙලා කාමයක් බවට පත් වෙනවා. අර ඉහත සඳහන් කළ ලිපියෙ අපේ ස්වාමීන් වහන්සේ ලියල තිබුණ වගේ, ඒ කාමයන් ගැන හිතන්න හිතන්න ඒවට ඇලෙනවා, ඒවට බැඳෙනවා, එතකොට ඒවායින් මත් වෙනවා. හොඳට මතක තියා ගන්න පුතා, මෙන්න මේ මත්වීමෙන් හරි වැරදි නොපෙනෙන නිසා තමා, කොයි ආකාරයෙන් හෝ ලබා ගන්න පෙළඹෙන්නෙ.

උන් වහන්සේ සඳහන් කරල තිබුණ වගේ, කාමය විවිධ ආකාරයෙන් අපව එයාගෙ උගුලට හසු කරගන්නවා. වෙලාවකට රූප දිගේ ඇදගෙන යනවා. මේක හොඳටෝම පේන තැනක් තමා, සෙල්ලම් බඩු සාප්පු ළඟින් සමහර දරුවො අරන් යන කොට ඈත ඉඳන් බැලුවම පේන්නෙ, ආපද රථයක් අමා...රුවෙන් කැඩිච්ච වාහනයක් ඇද ගෙන, කන්දක් නගිනවා වගෙයි. පව් නේද, ආපද රථයට කොච්චර වෙහෙස ඇතිද? කොහොම හරි ඒ උගුලෙන් ගැලවුණා කියමු, ඊළඟට ශබ්ද කාමය දිගේ ඇදන් යනවා. ගන්ධ කාමයත් එහෙමයි. රස කාමය ගැන නම් කතා කරන්න ඕනම නෑ නේද? පාරට බැස්සම පේන විවිධ කෑම වර්ග, නොයෙක් ආකාරයේ හෝටල් ඒකට හොඳට සාක්ෂි දරනවා. පහසට තියෙන කැමැත්ත ගැන හොඳම උදාහරණයක් තමා, පෝය දවසට සිල් සමාදන් වුණහම, අපේ දූල පුතාල බිම වාඩි වෙලා ඉන්න විදිය. දෙපැත්ත කැපිච්ච පණුවො වගෙයි දඟලන්නෙ.

මේ රූප, ශබ්ද, ගන්ධ, රස සහ පහස කියන කාම ගුණ, අප තුළට ඇතුළු වෙන දොරටු පහ පිහිටලා තියෙන්නේ කොහේද කියල පුතාල දූල දන්නවා නේද? මේවා උපතින්ම අපේ

ශරීරයේ පිහිටලා තියෙනවා. අපි රූප කාමයට හසු වෙන්නෙ ඇස තුළින්. කන තුළින් තමා ශබ්ද කාමයට අහුවෙන්නෙ. ගඳ සුවඳට අහුවෙන්නෙ නාසය තුළින්. දිවෙන් තමා රස කාමය අපව නටවන්නෙ. අපේ සිරුරට තමා පහස දැනෙන්නෙ.

අපි කොච්චර රූප බලන්න කැමතිද කියලා දරුවන්ට තේරෙන ආකාරයෙන් කිව්වොත්, අපට නොකා නොබී වුණත්, රූපවාහිනිය ළඟ පැය ගණන් ගත කරන්න පුලුවන් නේද? අද කාලෙ දරුවො නම් තාක්‍ෂණ දියුණුවත් එක්ක ඊටත් වඩා ඉදිරියට ගිහින්. තමන්ගෙම ජංගම දූරකථනයෙන් ඕනම වෙලාවක, ඕනම තැනකදි **මුහුණු පොතින්** ඔය දේම කරගන්නවා. රූප තණ්හාව පිනවන්න ගිහිල්ලා දෙමව්පියන්ගෙන්, ගුරුවරුන්ගෙන් වගේම පාරෙ යන එන අයගෙන් මොන තරම් බැනුම් අහල තියෙනවාද? අපහාස උපහාසවලට ලක් වෙලා තියෙනවද? ඒ වෙලාවට, වෙලාවක් අවේලාවක් තැනක් නොතැනක් ගැන හැඟීමක්වත් නෑ නේද? ඔය තණ්හාව, දරුවන්ට ඒ දේවල් ගැන හිතන්න ඉස්පාසුවක්වත් දෙනවද? හිතුණත් නොහිතුණා වගේ ඉන්න තමා පොළොඹවන්නෙ. පුතාලව නටවන්න හදන ඔය තණ්හාවට අහු වෙන්නෙ නැතිව, මධ්‍යස්ථව හිතලා බැලුවොත්, ඔය බලන දේවලින් බොහොමයක් වැටෙන්නේ වල් පල් කියන ගොඩට නේද? ඕපා දූප කියන ගොඩටම නේද?

රූප කාමය, ඇහැ පිනවන්න තියෙන ආශාව, වහල්ලු වගේ අපව නටවන බවට තවත් උදහරණයක් තමයි, අද කාලෙ තියෙන ඇඳුම් මෝස්තර පුංචි දුවේ පුතේ. ඇඳුම කියන්නෙ තමන්ගෙ චරිතය විදහා දක්වන කැඩපතක් කියල පැරණි කියමනක් තියෙනවා. පිරිසිදු චාම් සංවර ඇඳුමකින් කියවෙන්නෙ ඒ සිතේ තියෙන නිවුණු බවයි පුතේ. එහෙත්

අද තියෙන විවිධ මෝස්තර ඉදිරියේ නම් දරුවො වගේම වැඩිහිටියොත් අසරණයි කියලයි හිතෙන්නෙ. තමන්ට සුදුසු දේට වඩා වෙළෙඳ පොළේ තියෙන මෝස්තර රැල්ලට අහු වෙලා, ඒ දිගේ අන්ධයො වගේ ගසා ගෙන යන බවකුයි පේන්නෙ. අපේ බුදුහාමුදුරුවො කාමය සැඩ වතුර පහරකට උපමා කරල තියෙන්නේ ඒකනේ පුතා. ඒකට වැටුණ කෙනාට ගොඩවෙන්න ලේසි නෑ. ඇඳුමක් තුළින්, එහි මූලික අවශ්‍යතාව ඉටු කළා වගේම කෙනෙකුට සුන්දරත්වයක් ලබා දුන්නා විතරක් නෙවෙයි, දකින්නා තුළ පහන්බවක් ඇති කිරීමත් අතීතයේදි ඉටුවුණා පුතේ. ඒත් අද කාලේ, දකින්නා තුළ පහන් හැඟීම වෙනුවට, අසහනකාරී හැඟීම් ඉස්මතු කරන ස්වභාවයක් නේද පේන්න තියෙන්නෙ. යටපත් වී තිබෙන හැඟීම් ඉස්මතු කරන පසුබිමකදි, ඒ ආවේග පාලනය කරගන්න හැකියාවක් නැති අයගෙන් සිදුවන වැරදි වලට වගකිව යුතු වෙන්නෙ, තනිකරම ඒ අය ම ද, කියන ප්‍රශ්නෙ නිතර ම අපේ හිතට දැනෙනවා පුතේ.

අදට අපි මේ ලිපිය මෙතනින් නවත්වමු. එතෙක් මේ කියූ දේ හොඳින් මතක තියාගෙන, ඒ යහගුණය ජීවිතේට එකතු කර ගෙන, පුතාලා දූලත් යහපත් ව කටයුතු කරන අතරේ ම අනිත් අයට ද යහපත සැලසෙන සේ කටයුතු කිරීමට උත්සාහ ගන්න.

**අපේ පුංචි දූ-පුතුන්ට බුදු සරණයි..!**

***ලබන කලබට***





# අපි සැබෑ බෞද්ධයන් වී ජාතිය ගොඩනඟමු...!

*සිරි වජිරාරාම දහම් පාසලේ ධර්මාචාර්යාණී*
*අනුලා ප්‍රේමතිලක මහාත්මනිය විසිනි*

***පසුගිය කලබ හා සබැඳේ...***

ප්‍රබුද්ධ මනස තුළින් ලද හැකි සෞන්දර්යාත්මක රසවින්දනය වෙනුවට පසිඳුරන් පිනවීම තුළින් ලද හැකි පහත් ආස්වාදය පමණක් අරමුණු කොට ගෙන තැන තැන පවත්වන ඝෝෂාකාරී සංගීතයට මතින් දඟලන අඩනිරුවත් තරුණ කැළ මෙන්ම මැදිවියේ පසුවන පිරිස බාල පරපුරට දෙන ආදර්ශය කුමක්ද? නගරයෙහි විදුලි බුබුළුවලින් ආලෝකවත් වූ තරුපහේ හොටල්වල මෙන් ම ඈත ගම් දනව්වල ඇති දූවිලි පිරි කුඩා බිම් කැබලිවල ද මෙම වින්නැහිය දැන් සුලභ ව සිදුවෙයි. පරිහාණිය කරා ඇදෙන සියල්ලෝ අපේ ම දරුවෝ ය. බුදු වදනට අනුව ඒ මිනිසා සතු වස්තුවයි.

සැපය පිළිබඳ අදහස මුදල නම්, මල්ලට දමා තදින් ගැට ගසා, වෙන්දේසි කරමින් දුප්පතුන්ගේ කාසි මංකොල්ල කෑමේ අපූරු ක්‍රීඩාවන් නරඹන්නට පොරකන සමාජය මේ යන ගමනේ අවසානය කොයිබද? ඊර්ෂ්‍යාව, වෛරය, පළිගැනීම, අපහාස, උපහාස, අවමානය, හීනමානය, පුහුමානය, අහංකාරය ආදිය හෝ ඊට සමාන්තර තවත් බොහෝ දේ විනා

අන් කවර නම් සැපයක් අපට මේ මාවතෙන් උරුම වේදැයි මොහොතක් සිතා බලන්න.

මේ නම් සිහිනයකි. අනුන් ගේ නිදි පෙති අහුරු ගණන් ගිල දමා මර නින්දකට පිවිස ඇති ඔබ දකින බියකරු සිහිනයකි. ඔබ ඉන් අවදි වන විට ගතේ හිතේ පමණක් නොව වචනයේ ශක්තිය ද හොරු අරන් ගියා සේ දැනේවි.

බොදු සැදැහැවතුනි,

අවදි වන්න! අවදි වන්න!! ඔබට සැප උදා කරදෙන ඔබ සතුව ඇති මහා ධන නිධානයකි. කාලයේ වැලි තලාවෙන් එය වැසී ඇත. බටහිරින් හමා එන සැඩ සුළඟට හසු නොවී දැඩි අධිෂ්ඨානයෙන් හා ආත්ම විශ්වාසයෙන් යුතුව ඒ නිදානය මතුකර ගනිමු. මේ 2561 වන ශ්‍රී සම්බුද්ධ වර්ෂයයි. බුදු දහම සුරකින්නට නම් අවබෝධයෙන් තෙරුවන් සරණ යමු. දහම දැන ගනිමු. රස විඳිමු. ඒ අනුව ම හැසිරෙමු. නිවෙමු. සැනසෙමු. සැපෙන් සතුටින් ජීවත් වෙමු. මතු පරපුරට සතුටින් ජීවත් විය හැකි පරිසරයක් සකස් කර සිහියෙන් මිය යමු.

උතුම් බුදු සසුනෙහි චිරස්ථිතිය උදෙසා අවංකව, එඩිතරව කටයුතු කළහැකි උතුමන්ගේ පහළවීම ජාතියේ වාසනාවකි. බොදු හදවත් දැඩි කම්පනයට පත් කරවූ සිදුවීම්වලින් ගහණ අඳුරු සමය නිමාකර, දහම් එළියෙන් ජාතිය යළි පිබිදෙන යුගයෙක අරුණලු දකිමින් අද අපි සිටිමු. එවන් මොහොතක තමන්ගේ උපරිම සහයෝගය දැක්වීම සඳහා සැනසුම කැමති සැමදෙන සැදී පැහැදී සිටින බව නිසැක ය.

**අපි සැම මෙත් සිත් වඩමු! මෙත් සිතින් කතා කරමු! මෙත් සිතින් වැඩ කරමු! ජාතිය ගොඩනැගීමට වැඩිකල් නොයනු ඇත. සිත් තුළ මෙත් මල් පිබිදේවා!**



# “බාහුසච්චං ච සිප්පං ච - විනයෝ ච සුසික්ඛිතෝ”

***මහරගම ශ්‍රී වජිරඤාණ දහම් පාසලේ ධර්මාචාර්යාණී***
***කේ. කඳනෙආරච්චි මහාත්මනිය විසිනි***

පින්වත් දුවේ, පුතේ, අද මා ඔයාලට කියා දීමට යන්නේ මහා මංගල සූත්‍රයේ දී බුදු පියාණන් වහන්සේ වදාළ ගාථා රත්නයක්. එය මිනිසත් බවක් ලැබූ අපට ජීවත් වන විට විඳින්නට සිදුවන අපමණ දුක් ගැහැටවලින් මිදීමට උපකාරීවන රත්න, මාණික්‍ය, රුවන් පහක් තියෙනවා. ඒ පිළිබඳවයි. ඉන් එකක් තමා බහුශ්‍රැත භාවය. බොහෝ දේවල් පිළිබඳව දැන උගත්කමයි. ඒ සඳහා කුඩා කල සිට ම පොත් කියවන්න පුරුදුවන්න. දැන් පළවන පුවත් පත් තිබෙනවා එක එක වයස් මට්ටමට ඔබින සේ. විවිධ විෂයන් පිළිබඳ, පැරණි ජන ජීවිත සම්බන්ධ ව රසවත් සාහිත්‍ය ලිපි, නවකතා, කෙටිකතා පොත්, දුටුගැමුණු, වළගම්බා, මහ පැරකුම්බා ආදී යුග යුග වීරෝදාර රජ දරුවන් පිළිබඳව හා තවත් වීරකතා ආදි බොහෝ පොතපත ඇත. විද්වතුන් විසින් පවත්වන ලද දේශනවලට සවන් දීම තුළින් ද බොහෝ දැන උගත්කම ලබා ගත හැකි ය. බොහෝ ඇසූ පිරූතැන් ඇතිබව හෙවත් බහුශ්‍රැත භාවය ලබාගත හැකි ය. පුද්ගලයකුට තිබිය යුතු වැදගත් රත්නයක් තමයි බහුශ්‍රැත බව.

ඒ වගේ ම තමයි ශිල්ප ශාස්ත්‍රය දැනීම, හැම දෙනෙකු ම අකුරු ශාස්ත්‍රය ඉගෙන ගත යුතුයි. තාක්‍ෂණ වේදය බොහෝදුරට දියුණු වර්තමානයේ සියලු දෙනා ම ඒවා ඉගෙනුමෙන් බොහෝ දුරට දැනුම සොයා යා හැකියි. ශිල්ප ශාස්ත්‍ර කොතෙකුත් ඇත. ඒවා

ඉගෙනුම තම බුද්ධිය දියුණු කර ගැනීමේ මඟක් වේ. "උගතමනා ශිල්පය මැයි මතු රැකෙනා" යන වියත් පඬිවදන සිහිකොට ශිල්ප ශාස්ත්‍ර උගත යුතු ම යි. තමා උගතකු, බුද්ධිමතකු වන්නේ එවිට යි.

පුංචි පුතේ දුවේ ඔබ කොතෙක් දුරට ශිල්ප ශාස්ත්‍ර හදාරා උගතකු වුවත් බහුශ්‍රැත භාවයෙන් අගතැන්පත් වුවත් ඔබ තුළ විනයක් ද තිබිය යුතු යි. හික්මුණු විනය ගරුක පුද්ගලයෙක් හැම විට ම නීතිගරුක ය. ඔහු කිසිවිටක අයුතු දේකට, අකැප දේකට, හිස නො නමයි. දිවියතත් බොරුවක් නො කියයි. උතුම් ශීලාචාර ගති ආරක්ෂා කරයි. හිරි-ඔතප් හෙවත් ලජ්ජා භය දෙක එබඳු පුද්ගලයා තුළ කැපී පෙනෙන ලක්ෂණයකි. එකිනෙකා අබිබවා යන ලෝකයේ සත්‍ය ජය ගැනීමට පසුබට නොවිය යුතු යි. යහපත් වචන කථා කිරීමෙන් හා සුචරිතයෙහි යෙදීමෙන් සමානාත්මතාව රැකගෙන පොදු ධර්මතාවකින් ජීවත්වීමට උත්සාහ කළ යුතුයි. උගත් අනතිමානී පුද්ගලයා නම්‍යශීලී ය. බොහෝ පුද්ගලයෝ තනතුරු, උසස්වීම් ලැබෙන විට අහංකාරකමින් හිස උදුම්මා ගනිති. එය හොඳ ගති ගුණයක් නොවේ. හැමවිටම දුවේ පුතේ අපි අනෙකාගේ අදහස්වලට ගරු කළ යුතුයි. අන්‍ය මත ඉවසිය යුතුයි. උගත්කමේ හිණිපෙත්තට ගියත් නොමිනිස් වැඩ කරයි නම් එබඳු පුද්ගලයා ආධ්‍යාත්මික ගුණයෙන් ගෙන් පිරිහුණු තැනැත්තෙකි. ඔහුගෙන් සමාජයට වන්නේ අයහපතකි. ඔහු සමාජයට කළු ලපයකි. කැළලකි. උගත් පුද්ගලයා බුද්ධිමතෙකි. ඔහු තුළ ලජ්ජා භය දෙක ඇත්නම් ඔහු සමාජයට මල් කලබකි.

පින්වත් පුතේ දුවේ අප විසින් කළයුතු වන්නේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති පුද්ගලයකු වීමට බොහෝ දේ දැන උගෙනීමයි. ශිල්ප ශාස්ත්‍රය මනාව ඉගෙන හොඳ බුද්ධිමතකු වන්න. තම බුද්ධිය විකසිත වීමට ඉවසීමෙන්, විනය ගරුක භාවයෙන් හා සුචරිත භාවයෙන් යුතුව ක්‍රියා කරන්න. ඒ සඳහා බුදු පියාණන් විසින් අපට කියාදුන් මංගල කරුණු හොඳින් තේරුම් ගෙන සමාජයට අවතීර්ණ වන්න. එවිට ඔබත් හැදේවි. රටත් හැදේවි.

**ඔබ සැමට තෙරුවන් සරණයි...!**



# තින්දුක ජාතකය

***කොළඹ විශාඛා විදුහලේ විශ්‍රාම ලත් ආචාර්යාණී***
***ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි***

ප්‍රඥා නම් විශිෂ්ට ඥානයයි. ප්‍රඥා පාරමිතාව දස පාරමිතාවලින් එකකි. මහා කාරුණික සර්වඥයන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි දී ප්‍රඥා පාරමිතාව අරබයා මෙම ජාතක ධර්මය දේශනා කළ සේක.

දම් සභාවෙහි රැස් වූ භික්ෂූන් වහන්සේලා හට එදින කතිකාවට බඳුන් වූයේ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රඥා ගුණයයි. ප්‍රඥා පාරමිතාවයි. එපවත් දැන, තමන් වහන්සේ තිරිසන් ව සිටිය දී පවා තමන්ගේ ප්‍රඥා බලයෙන් එනම් විශිෂ්ට ඥාන බලයෙන් බොහෝ අය හට සතුන් හට පිහිට වූ බැව් බුදුරජාණන් වහන්සේ වදාළ සේක. භික්ෂූන් වහන්සේලාගේ දැන ගැනීම පිණිස උන් වහන්සේ අතීත කථාව මෙසේ වදාළ සේක.

ඈත අතීතයෙහි බඹදත් නම් රජ කෙනෙකුගේ කාලයෙහි අප මහ බෝසතාණන් වහන්සේ වඳුරකු ව ඉපිද වඳුරු රැළකට නායක ව, එල බරින් පිරුණු වනයෙහි, පළතුරු කොළ දළු බුදිමින් සතුටින් වාසය කළහ. වනය අසල පිහිටි පාළු ගමක පල බරින් අතු ඉති නමා වැටුණු තිඹිරි ගසෙකි. වනයෙහි අහර හිඟ වූ විටෙක වඳුරු රැළ පාළු ගමට පැමිණ තිඹිරි ගෙඩි කෑමට පුරුදු වී සිටියහ.

පසු කලෙක මිනිසුන් මෙම ගමෙහි පදිංචියට ආහ. නිවෙස් සාදා ගත්හ. නැවත මල් පිපී තිඹිරි ගස එලබර වන්නට විය. වඳුරු රැළෙහි වඳුරෙක් තිඹිරි ගෙඩි පිරී ඇති බැව් දැන වඳුරු නායකයා හට දැනුම්

දුන්නේ ය. මේ වන විට ගමෙහි මිනිසුන් වසන නිසා එහි නොයා යුතු බැව් වඳුරු නායකයා තම රැළට අවවාද කළේ ය. එහෙත් රෑ බෝ වන තුරු ගම අසල රැක සිටි සෙසු වඳුරෝ කුසගින්න ඉවසාගත නොහැකිව ගසට නැග්ගාහ.

මේ බැව් දුටු එක් ගම් වැසියෙක් මුළු ගමට ම ඇසෙන සේ කෑ ගැසුවේ ය. අනෙක් ගම් වැසියෝ දඬු මුගුරු රැගෙන පැමිණ තිඹිරි ගස වට කළහ. කෙසේ හෝ මිනිසුනට නොදැනෙන්නට එක් වඳුරෙක් බෝසත් වඳුරු නායකයා වෙත ගොස් සිය පිරිස උගුලකට අසුවී ඇති බැව් පැවසුවේ ය.

තම ප්‍රඥාව මෙහෙයවූ වඳුරු නායකයා "මනුෂ්‍යයෝ බොහෝ විට කලබල වෙති. තමන් කරමින් සිටිනා ක්‍රියාව අමතරක කර වෙනත් ක්‍රියාවක් සඳහා තම සිත යොදවන බැව් නොදන්නෙහි" දැයි විමසා සිටියහ.

තම කණ්ඩායම බේරා ගැනීමට මගක් සිතමින් සිටි වඳුරු නායක තැන ගිනි මැලයක් අසල කපු කටින මහලු ගැහැණියක දුටුවේ ය. උපායශීලී ව කල්පනා කළ වඳුරු නායකයා අනෙක් වඳුරාට පැවසූයේ දිව ගොස් ගිනි පෙනෙල්ලක් රැගෙන පලා යන ලෙසයි. වඳුරා එසේ දුවන කල වීදියේ තැනින් තැන තණ ආදිය ගිනි ගන්නට විය. බෝසත් වඳුරු නායකයා පැවසූ ලෙසට ම ගම් වැසියෝ තිඹිරි ගස අතහැර ගින්න පවතින වීදිය දෙසට දිව ගියහ. තමන් ගස වටා රැකවල් දැමූ බව අමතක කළහ. නිදහස ලත් වඳුරු රැළ පලා ගියහ. බෝසත් වඳුරු නායකයා තම ස්ථානෝචිත ප්‍රඥාව මෙහෙයවා තම වඳුරු ළ බේරාගත් අයුරු තින්දුක ජාතකය කියා දේ.

එකල වඳුරු රැළ අද බුදු පිරිස ය. වඳුරු නායකයා තමන් වහන්සේ යැයි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

දරුවන්ට මෙන් ම වැඩිහිටියන්ට ද මෙම බෝසත් වඳුරු නායකයා පාඩමක් උගන්වයි. එනම් තැනට සුදුසු නුවණ නැතිනම් ස්ථානෝචිත ප්‍රඥාව මෙහෙයවා අපහට සිදුවන්නට යන විපතින් මිදිය හැකි බවයි. පොත පතින් ලබා දෙන දැනුම මෙන් ම නිසි පරිදි ප්‍රඥාව මෙහෙයවීම ද අපහට ජීවිතය ජය ගත හැකි අංග දෙකක් බව මෙයින් පැහැදිලි වේ.



# THERI UPPALAVANNĀ

(DHAMMAPADA V - 69)

Compiled by: ***Srima Warusawithana***

*Calgary, Canada*

Blue lotus her complexion, exceedingly beautiful she was,
So her name Uppalavannā – a wealthy nobleman's daughter
Of wisdom and virtue endowed,
Once in a bygone aeon in the time of Buddha Padumuttara
She beheld the Buddha naming a bhikkhuni as the foremost female chief disciple.
Happiness filled her heart, seven days in quick succession,
She gave alms to the holy ones and wished with faith and determination
To be such as this bhikkhuni – a chief disciple of a future Buddha...
On the round of heavenly births thereafter, in the human realm once more,
She offered blue lotus blooms to a silent Buddha
With a wish that in her future birth, her skin be graced by the colour of a blue lotus;
Thus in the time of Buddha Gotama, the maiden with skin the colour of blue lotus
Grew up in her father's mansion, virtuous, wise and beautiful;
Many suitors wished to woo her, but her wish was not for mundane household life...
She implored her parents to offer her to the sasana as a Bhikkhuni.
The wise parents consented and with a
Beautiful, graceful Uppalavanna was taken to the Nunnery where lived Bhikkhunis.
She was ordained, heedful and conscientious in the holy discipline,
Before long attained the final path of sanctity – an arahat Theri she became –
In a simple hut in the forest spent her life in solitude enjoying the bliss of Nibbana...
Then one night a young man named Nanda her cousin in lay life who had set eyes upon her,
Entered her hut stealthily, hidden inside whilst she was away on alms round,
And in the dark of night, amidst her protests defiled her, as his feet touched the ground
The heinous act he caused to a perfectly awakened arahat theri made the mighty earth
Swallow the villain up...a deed that brought him untold misery.
The Buddha hearing this sad tale expressed the words,
"Wrong action seems sweet to the fool until the reaction comes and brings pain;
When the bitter fruits of the vile deeds have ripened, these have to be eaten by the fool".



# සසර වසන තුරු - නිවන් දකින තුරු
# හෙළ රන් දෙරණට ඔබ වාසනාවකි

*සිරි වජිරාරාම දහම් පාසලේ (8 ඊ ශ්‍රේණියේ)*
*සෙත්මි චන්දිරා විරිත්තමුල්ල දියණිය*

හෙළයේ මහා ගාන්ධර්වයාණන් වූ පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේවයාණෝ යනු සංගීතය නමැති සයුරු පත්ලේ කිමිදී, මිනිසුන් ගීතයෙන් රසවත් කළ උත්තම ගණයේ මිනිසෙකි. එතුමා රටට ඉමහත් සේවයක් කළ අතර මිනිසුන් සමඟ ඉතා සුහදශීලි කතා බහක යෙදුණු බුද්ධිමතෙකි.

මොරටුව කොරලවැල්ලේ වඩුකාර්මික පවුලක 1927 දෙසැම්බර් 05 වන දින උපන් මොහු ඇල්බට් පෙරේරා නම් විය. කොරලවැල්ල විද්‍යාලයෙන් ඉගෙනුම ලබා පාණදුර සුමංගල විද්‍යාලයෙන් ද, බළපිටිය සිද්ධාර්ථ විද්‍යාලය ඇතුළු පාසල් දෙකකින් ද අධ්‍යාපනය හදාළ මෙතුමාගේ කලාවේ මූලාරම්භය සිය නිවෙස ම විය. එතැන් පටන් ශ්‍රී ලංකාවේ සංගීතය හදාරමින් ක්‍රමයෙන් ඉදිරියට ආ එතුමා ඉන්දියාවේ ලක්නව් සංගීත ආයතනයෙන් විශාරද උපාධිය ලබා ලංකාවට පැමිණියේ, මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් තැබූ 'අමරදේව' නාමය වඩවඩාත් අර්ථවත් කරමිනි.

එතැන් පටන් විශිෂ්ට සංගීතඥයකු වශයෙන් එතුමා සිනිඳු සුදුමුදු තලාවේ, මහබෝ වන්නම, සේසත් නංවා සහ දේශාභිමානී ගී වශයෙන් රත්නදීප ජන්මභූමි, සසර වසන තුරු ආදි ගීත ගායනා කළේ ය. දේශීය සංගීත රටාවක් බිහි කරමින් ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, මහගම සේකර, මඩවල එස් රත්නායක ආදීන් ගේ ගී පද රචනවලට මහත් අනුප්‍රාණයක් දුන්නේ ය.

මාලදිවයින් රජයේ අනුග්‍රහයෙන් එහි ජාතික ගීය ද නිර්මාණය කළ අමරදේවයාණෝ ශ්‍රී ලංකාවේ අසහාය ගාන්ධර්වයාණන් බවට පත්වූහ. එමෙන් ම පිලිපීනයේ මැග්සේසේ සම්මානයෙන් පිදුම් ලැබූහ. සමාජයේ සියලු රසිකයන්ගේ ආදරයට හා ගෞරවයට පාත්‍ර වූ අමරදේවයාණන් හෙළයේ මහා ගාන්ධර්වයාණන් බවට සැකයක් නැත. ඒ උතුම් කලාකරුවාට අමාමහ නිවන් සුව ප්‍රාර්ථනා කිරීම අපගේ පරම යුතුකමයි.

මහ කලා ගුරු ගාන්ධර්වයාණනි ඔබට
සසර වසන තුරු - නිවන් දකින තුරු
පින්කෙත හෙළ රන් දෙරණේ - යළි උපදින්නට
හේතු වාසනා වේ වා....





# බුදු පුතුනි

***සිරි වජිරාරාම දහම් පාසලේ ධර්මාචාර්යාණී***
***ශ්‍රියානි චිත්‍රා ජයලත් මහාත්මනිය විසිනි***

වස්සාන කාලයේ වප් මහේ ශනි දිනෙක
අහඹු ලෙස ගම් පියසෙ පන්සලේ බණ මඩුවෙ
දම් අසුන සරසමින් වැඩ හිඳින්නට වරම
ලද පුතුනි, ණය නැති ය ඔබ අපේ ගම රටට

පුතු වඩිනු දකින්නට - දම් දෙසනු අසන්නට
පින් කළා අපේ නෙත් - අපටත් ම නොදැනී ම
ගම් පියසෙ හිතවතුන් - උවසු උවැසියන් හැම
නිවනින් ම නිවන්නට සිතුණා ද බුදු පුතුට

සසර දුක් නිවුණා - බුදු බණක් ඇසුණා
දෙසූ දම සරල මැ යි - සුගම යැයි සිතුණා
දහම් ඇස ඇරුණා - අම නිවන් දැනුණා
බුදු පුතාගේ හඬින් - බුදු බණක් ඇසුණා